**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 03 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව අගලවතත ප්‍රදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැන්පත් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ මිශ්‍ර තැන්පත් ගෙවීම් රු.354,098 ක් වුවද රු.654,098 ක් ගෙවීම් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් රු.300,000 ක් ලේඛනගත වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.101,293 ක් වූ ආයුර්වේද ඖෂධ තොගයේ වටිනාකම පරිත්‍යාග ගිණුමට බැර කිරීම වෙනුවට ආයුර්වේද ගබඩා වැය ගිණුම බැර කර තිබුණි.

(ඇ) වැය ශීර්ෂ 106 සහ 205 සඳහා ගිණුම් ගත කර තිබූ උපචිත වියදම් පිළිවෙලින් රු.187,400 ක් සහ රු.50,051 ක් විවිධ ණයහිමියන් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) පොදු මුදල් ගිණුමෙන් කර්මාන්ත මුදල් ගිණුමට මාරු කර තිබූ රු. 1,099,809 ක් කර්මාන්ත මුදල් ගිණුම හර කර පොදු මුදල් ගිණුම බැර කර තිබියදී රජයේ ආධාර ණයගැති ගිණුමද බැර කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දී කර්මාන්ත 72 ක් සඳහා එකතුව රු.11,553,125 ක් ගෙවීම් කර තිබූ නමුත් ඒවා ඉකුත් වර්ෂය අවසානයට වූ කර්මාන්ත ණයහිමි උපලේඛනයේ හෝ සමාලෝචිත වර්ෂය සඳහා වූ කර්මාන්ත උපලේඛනයේ සඳහන් වී නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 124,977,728 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,062,678 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 2,274,366 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| (i.) වරිපනම් හා බදු | 2,389 | 2,172 | 430 |
| (ii.) බදු කුලී | 1,561 | 1,530 | 40 |
| (iii.) බලපත්‍ර ගාස්තු | 120 | 120 | -- |

2:2:2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,231,075 |
| (ii) | මුද්දර ගාස්තු | 262,749 |

2:3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අනුමත කර තිබූ කර්මාන්ත ක්‍රියාත්මක නොකිරීම

2012 වර්ෂයේ මග නැගුම වැඩ සටහන යටතේ රු.500,000 ක් බැගින් අනුමත වී තිබූ ව්‍යාපෘති 04 ක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබූ නමුත් විගණිත දිනය වූ 2013 මාර්තු වන විටත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පුංචිකන්ද මාර්ගය II අදියරේ කුට්ටිගල් ඇතිරීම

මග නැගුම ව්‍යාපෘතිය යටතේ ආරම්භ කර තිබූ පුංචිකන්ද මාර්ගය II අදියරේදී කුට්ටි ගල් ඇතිරීම සඳහා 2011 සැප්තැම්බර් 03 දින පිඹුර ගොවි සංවිධානය සමඟ රු.500,000 ක ගිවිසුම්ගත මුදලක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. මාර්ගයේ දිග මීටර් 103 ක් හා පළල මීටර් 2.45 ක් විය. කුට්ටි ගල් අතුරන ලද මාර්ගයේ ගල් අතර බොහෝ සෙයින් හිඩැස් මතුවී තිබූ බවත් මාර්ගයේ ඉහළ කොටසෙහි ගල් අතර තණකොළ වැවී තිබුණු බවත් 2012 මාර්තු 22 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) ගිරිකොල බටේවලකඩ මාර්ගයේ කුට්ටිගල් ඇතිරීම

මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන 2012 යටතේ ගිරිකොල බටේවලකඩ මාර්ගය මීටර් 100 ක් දිගට මීටර් 2.5 ක් පළලට කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කිරීම සඳහා රු.500,000 ක මුදලක් 2012 අගෝස්තු 08 දින අනුමත වී තිබුණි. ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා 2012 නොවැම්බර් 16 දින සමෘද්ධි බලකාය සමඟ ගිවිසුම් ගත වී තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ව්‍යාපෘතියේ අවසන් ගෙවීම සඳහා මැණුම් ගැනීම 2012 දෙසැම්බර් 03 දින සිදු වී තිබූ අතර එහිදී අතුරන ලද කුට්ටි ගල් කුස්තුර අතර වැලි පිරවීම සඳහා රු.15,500 ක් නිර්දේශ කර

---

ගෙවීම් කර ඇතත් භෞතික පරීක්ෂණ දිනය වන 2013 මාර්තු 22 දින වන විට එම කුස්තුර නැවත මතුවී තිබෙණු නිරීක්ෂණය විය.

(ii) 2012 අගෝස්තු 08 දිනැති D/03/12 දරන මහ නැඟුම ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන -2012 ලිපිය අනුව රු.500,000 ක ව්‍යාපෘතියක් සඳහා කුට්ටි ගල් 10100 ක් ඇතිරීම කළ යුතු බවට උපදෙස් දී තිබියදී ඉහත මාර්ගයේ වර්ග මීටරයකට අතුරා තිබූ ගල් ප්‍රමාණය 37 ක් බව භෞතික පරීක්ෂාවේදී ගන්නා ලද මැණුම් අනුව නිරීක්ෂණය වීමෙන් මාර්ගයේ අතුරා තිබූ කුට්ටි ගල් ප්‍රමාණය දළ වශයෙන් 9250 ක් විය. ඒ අනුව ගල් 850 ක් පමණ අඩුවෙන් අතුරා තිබුණි.

(ඇ) ගිරිකොල බටේවලකඩ පානීය ජල යෝජනා ක්‍රමය

---

ඉහත ව්‍යාපෘතිය සඳහා ළිඳ හා ජල ටැංකිය ඉදි කිරීම සහ ජල නල එලීම වෙනුවෙන් රු.978,224 ක ඇස්තමේන්තුවක් සඳහා 2012 දෙසැම්බර් 03 දින ගිරිකොළ සමෘද්ධි බලකාය සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. 2012 දෙසැම්බර් 24 දින රු.196,087 ක අත්තිකාරම් මුදලක් ද 2012 දෙසැම්බර් 29 දින පළමු කොටස් ගෙවීම කර තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) කොන්ත්‍රාත්කාර සමිතිය විසින් 2012 දෙසැම්බර් 29 දින ඉදිරිපත් කර තිබූ බිල්පත සඳහා සභාවේ කාර්මික නිලධාරී විසින් රු.375,837 ක ගෙවීම් නිර්දේශ කර තිබුණි. ඒ සඳහා ගෙවීම් කිරීමේදී 2012 ඔක්තෝබර් 24 දින ගෙවා තිබූ රු.196,087 ක අත්තිකාරම් මුදල හා බිල්පතේ වටිනාකමින් 10% ක අත රැඳවුම් මුදල් අඩු කර නොගෙන බිල්පතේ සඳහන් මුළු මුදලම ගෙවා තිබුණි.

(ii) විගණිත දිනය වූ 2013 මාර්තු 22 වන විට, ව්‍යාපෘතිය අවසන් කර මාස 3 කට ආසන්න කාලයක් ගත වී තිබුණද ජල ටැංකියේ සිට මාර්ගයේ දෙපස ජල නල එලා නොතිබීමෙන් ප්‍රතිලාභීන්ට ජලය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

2.4.1 ඉඩම් විකිණීම මත බදු

---

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් විකුණනු ලබන විට හෝ වෙන්දේසි කරනු ලබන විට එම විකුණුම් වටිනාකමින් සියයට 1 කට සමාන බද්දක් ප්‍රාදේශීය සභාව විසින් අයකරගත යුතු වුවත්, 2010, 2011, 2012 වර්ෂවල වෙන්දේසි කර විකුණ තිබූ ඉඩම් 05 කින් ඇස්තමේන්තුගත විකුණුම් වටිනාකම මත බදු අය කර තිබුණි.

2.4.2 ඉඩම් අනු බෙදුම් සම්බන්ධයෙන් අනුකූලතා සහතික නිකුත් කිරීම

අනුකූලතා සහතිකයක් ලබා නොගෙන ඉඩම් කට්ටි විකිණීම/පරිහරණයට ගැනීම/ගොඩනැගිලි ඉදි කිරීම 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ඒ (1) වගන්තිය ප්‍රකාරව අනවසර සංවර්ධන කටයුත්තක් වන බව දක්වා තිබුණද, සභාව විසින් අනුමත කර තිබූ ඉඩම් අනුබෙදුම් 04 ක් සඳහා අනුකූලතා සහතික ලබා ගෙන නොතිබුණි.

2.4.3 පරිත්‍යාග

2008 පෙබරවාරි 18 දින පරිත්‍යාග ලෙස ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබී තිබූ සාස්පාන් කට්ටල 328 ක් බෙදා දීමට කටයුතු නොකර 2013 මාර්තු 22 වන විටත් සභා ගබඩාවේ තිබුණි. පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළුම වර්ගයේ අයිතමයන් සටහන් කිරීම සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි.

2.4.4 සේවක ඇප

පළාත් පාලන කොමසාරිස්ගේ 2004 ජූලි 09 දිනැති අංක LG/05/2004 දරන චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 9 කගෙන් එකතුව රු.65,000 ක ඇප මුදල් අයකර ගැනීමට 2004 වර්ෂයේදී තීරණය කර තිබුණද එම මුදල අය කිරීම මාසිකව රු.100 තරම් වූ අඩු මුදලක් වීම නිසා 2012 දෙසැම්බර් 31 වන විටත් අය කර තිබූ මුළු ඇප මුදල රු.38,100 ක් විය.

2.4.5 වත්කම් සමීක්ෂණය

(අ) 1988 අප්‍රේල් 17 දනැති අංක 55/4 දරන ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව සෑම වර්ෂයකටම වරක් සභාව සතු ඉඩම් සමීක්ෂණය කළ යුතු වුවද සභාව සතු ඉඩම් 79 ක පමණ සමීක්ෂණ කටයුතු ඉටු කර නොතිබුණි.

(ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

2.4.6 වාහන පාලනය

වාහන 08 ක 2012 වර්ෂයට අදාල ධාවන සටහන් විගණිත දිනයට ඉදිරිපත් නොකෙරුණි. වාහන සඳහා ඉන්ධන නිකුත් කිරීමේදී ධාවන සටහන්වල ඉන්ධන ගැලපීම් සිදු කර ඒ අනුව එදිනෙදා අවශ්‍ය වන ඉන්ධන ප්‍රමාණය නිකුත් කිරීමට නිර්දේශ කළ යුතු වුවත් ඉහත සඳහන් වාහන සඳහා ධාවන සටහන් ඉදිරිපත් වී නොතිබියදී ඉන්ධන කිකුත් කර තිබුණි.

2.4.7 අත්තිකාරම් ගෙවීම්

1993 සිට 2006 දක්වා කාලය තුළ ගෙවා තිබූ එකතුව රු.273,904 ක් වූ අත්තිකාරම් ශේෂයක් විගණිත දිනය වූ 2013 අප්‍රේල් 05 වන විටත් පියවාගෙන නොතිබුණි.

2.5 අභ්‍යන්තර විගණනය

1988 ප්‍රාදේශීය සභා රීති සංග්‍රහයේ 5 රීතියේ 7 උප රීතිය සහ V ප්‍රකාරව මූල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගැනීම සභාපතිගේ කාර්යභාරයක් වුවද එසේ කටයුතු කර නොතිබුණි.

2.6 අයවැය පාලනය

2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව වැය විෂයයන් 15 ක් සඳහා එකතුව රු.1,920,100 ක් වූ මුදලක් වෙන් කර තිබූ නමුත් ඉන් කිසිදු මුදලක් වියදම් වී නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය